www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාන්ඩුවේ "සාම" කමිටුව බිඳ වැටීමේ අද්දර

## Sri Lankan government's "peace" committee on point of collapse

**කේ. රත්නායක විසිනි**
**2007 සැප්තැම්බර් 01**

රට තුල දිගු කලක් තිස්සේ පැවත එන සිවිල් යුද්ධය අවසන් කිරීම සඳහා ව්‍යවස්ථාමය සැලැස්මක් සකසා ගැනීමේ අරමුණින් පසු ගිය වසරේ දී ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් දියත් කරන ලද සර්ව පාක්ෂික නියෝජිත කමිටුව (ඒපීආර්සී) යන්තම් බිඳ නොවැටුනා පමනකි. පුදුමයක් වනවා වෙනුවට කමිටුව අසාර්ථක වීමෙන් තහවුරු වන්නේ, ආන්ඩුවේ න්‍යාය පත්‍රයව පැවතියේ සාකච්ඡාව තුලින් සාමයක් ඇති කිරීම නො ව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය යලි ඇරඹීම ය යන්න යි.

අගෝස්තු 14 වන දා රාජපක්ෂ නියෝජිත කමිටුවේ වැඩ කටයුතු අනියත කාලයකට අත්හිටුවීමට පියවර ගත්තේ ය. ජාතික හෙල උරුමය (ජාහෙඋ), මහජන එක්සත් පෙරමුන (මඑපෙ) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන සිංහල අන්තවාදී පක්ෂ සමග එක්ව ඔහුගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ද කවරාකාර හෝ සමාප්ති වාර්තාවක් නිකුත් කිරීමට විරුද්ධත්වය පල කලේ ය. ජවිපෙ කැබිනට් මන්ඩලයේ කොටස්කරුවන් නො වී පාර්ලිමේන්තුව තුල දී ආන්ඩුවට සහාය දෙන අතර, ජාහෙඋ හා මඑපෙ පාලක සන්ධානයේ කොටස්කරුවෝ ය.

කමිටුව තුල සිටින අනෙකුත් පක්ෂවල අදහස් නියෝජනය කරමින්, පලාත්වලට බලය විමධ්‍යගත කිරීම ඇතුලත් ෆෙඩරල් ව්‍යවස්ථාවකට පක්ෂව " බහුතරයේ" වාර්තාවක් නිකුත් කිරීමට සූදානම් වීම සම්බන්ධයෙන්, හෙල උරුමය හා ජවිපෙ, නියෝජිත කමිටුවේ සභාපති තිස්ස විතාරන හෙලා දුටුවේ ය. පසු ගිය දශක දෙක තිස්සේ පැවති සියලු සාම සාකච්ඡාවල පදනම බවට පත් වී තිබූ එවන් යෝජනාවක් සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් විසින් සලකනු ලබන්නේ අතිශය පිලිකුල් සහගත දෙයක් ලෙස ය.

අගෝස්තු 19 වන දා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, එල්ටීටීඊයට සහාය දෙන "කුමන්ත්‍රනකරුවෙකු"යි හඳුන්වමින් හෙල උරුමය නායක චම්පික රනවක විතාරන හෙලා දුටුවේ ය. "අද අපි නැගෙනහිර දී මිලිටරි ජයග්‍රහනයක් අත් කර ගෙන තියෙනව. උතුරු දෙසට යන්න සැලසුම් කරල තියෙනව ... මිලිටරිය අත් කර ගත් ජයග්‍රහන පෙරලා දාන්න කුමන්ත්‍රනයක් පවතිනව. අපි දැන ගන්න කැමති යි, මහාචාර්ය විතාරන මේ කුමන්ත්‍රනයේ කොටස්කරුවෙකු හැටියට ක්‍රියා කරනව ද කියල," ඔහු පැවසී ය.

රනවකගේ සැඳහුම් ආන්ඩුවේ න්‍යාය පත්‍රය පැහැදිලි කරයි. 2002 සටන් විරාමය විවෘතව ම උල්ලංඝනය කරමින් නැගෙනහිරෙහි එල්ටීටීඊ ප්‍රදේශ අත්පත් කර ගැනීමට ආක්‍රමන මාලාවක් දියත් කල මිලිටරිය දැන් උතුරෙහි එල්ටීටීඊ ස්ථාපිතයන්ට පහර එල්ල කිරීමට සූදානම් වෙයි. අරමුන වී තිබෙන්නේ, සිංහල-බෞද්ධ රාජ්‍යයක ආධිපත්‍යය පවත්වා ගෙන යනු පිනිස එල්ටීටීඊය ද රටේ දෙමල සුලුතරයෙන් මතු වන මොන යම් හෝ විරුද්ධත්වයන් ද කුඩු කර දැමීම යි. හෙල උරුමය සිතන පරිදි, සම්මුතියක් ඇති කර ගැනීම සඳහා කරන කවර කතාබහක් වුව ද රාජද්‍රෝහී ක්‍රියාවක් වෙයි.

2006 මැයි මාසයේ දී රාජපක්ෂ ඒපීආර්සීය පිහිටුවූයේ මිලිටරි ආක්‍රමනය සඳහා සැලසුම් සකසන අතරවාරයේ දී ය. එල්ටීටීඊ හිතවාදී දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) හැර, විරුද්ධ පක්ෂය ලෙස කටයුතු කරන එක්සත් ජාතික පක්ෂය (එජාප) ද ඇතුලු පාර්ලිමේන්තුව තුල සිටින සියලු පක්ෂ කමිටුවට සිය නියෝජිතයන් යැවී ය. කිසිදාක කමිටුවේ අරමුන වූයේ සාම සාකච්ඡා සඳහා පදනම දැමීම නො ව, යුද්ධය යලි ඇරඹීමට එරෙහිව නැගෙන මහජන විරුද්ධත්වය මොට කිරීම යි.

එමෙන් ම, ඒපීආර්සීය ජාත්‍යන්තර වශයෙන් එල්ල වන විවේචන වෙනතකට යොමු කිරීමට උචිත උපක්‍රමයක් ද විය. ප්‍රහාර එල්ල කිරීමට ආරක්ෂක හමුදාවලට අන දෙද්දී ම සාකච්ඡා සඳහා සූදානම් වෙමින් සිටින බව ප්‍රකාශ කරන්නට රාජපක්ෂට පුලුවන් විය. ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාවලියේ අනුග්‍රාහකයන් සම්බන්ධයෙන් ගත හොත්, ආන්ඩුව 2002 සටන් විරාමය ඉරා දැමීම නො තකා සිටින්නට කමිටුවෙන් ඔවුන්ට ව්‍යාජ හේතුවක් සම්පාදනය විය. රාජපක්ෂ යුද්ධයට දේශපාලන විසඳුමක් ඇති කර ගැනීමට උත්සාහ කරමින් සිටිතැයි මවා පෑමට එක්සත් ජනපදයට, යුරෝපා සංගමයට, ජපානයට හා නෝර්වේ රාජ්‍යයට හැකියාව ලැබින.

මිලිටරිය හා එහි පැරා-මිලිටරි සගයන් එල්ටීටීඊය දුර්වල කරමින් හා පලි ගැනීමට එය පොලඹවමින් ඒ වන විටත් සැඟවුනු යුද්ධයක නිමග්නව සිටියේ ය යන්න පිලිබඳ සංඥාවන් වැඩි වැඩියෙන් ලැබෙමින් තිබිය දී ම, කොලඹ මාධ්‍ය සාමය දෙසට තබන ලද ඉදිරි පියවරක් යැයි ඒපීආර්සීයට හුරේ දැමී ය. 2006 ජුලි මස අග හරියේ දී, නැගෙනහිරෙහි මාවිල්ආරු ප්‍රදේශයේ දී මිලිටරිය සිය පලමු විවෘත ආක්‍රමනය දියත් කලේ ය. හමුදා මෙහෙයුම හුදෙක් ගඟ පහල කොටස්වල සිටින ගොවීන්ට වාරි ජලය සැපයීම සඳහා වූ "මානුෂීය" මෙහෙයුමකැයි කියාපාමින් ආන්ඩුව මාවිල්ආරු අමුන වසා දැමීමේ වාසිය ඩැහැ ගත්තේ ය. ඉන් අනතරුව සිදු කල සිය මෙහෙයුම් මගින් මිලිටරිය එබඳු මවා පෑම් දුරු කර දැමී ය.

මේ තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස, ඒපීආර්සීය උපන් ගෙයි ම මිය ගියේ ය. 2005 නොවැම්බරයේ දී රාජපක්ෂගේ තේරී පත් වීමට මුක්කුව දී තිබූ ජවිපෙ හා හෙල උරුමය එල්ටීටීඊයට හෝ රටේ දෙමල සුලුතරයට කවර සහනයක් වුව සැලසීමට සතුරු විය. දෙමල ජනයාගෙන් බහුතරයක් දිවි ගෙවන උතුරට හා නැගෙනහිරට බලය විමධ්‍යගත කරන " ෆෙඩරල්වාදයක්" සඳහා ගනු ලබන කවර පියවරකට වුව තමන් විරුද්ධ බව ප්‍රකාශ කරමින් පසු ගිය දෙසැම්බරයේ දී ජවිපෙ ඒපීආර්සීයෙන් ඉවත්ව ගියේ ය.

මැයි මාසයේ දී ඒපීආර්සීයට ඉදිරිපත් කල ශ්‍රීලනිපයේ ම යෝජනාවන් මගින් ද කවර හෝ ෆෙඩරල් වැඩ පිලිවෙලකට විරුද්ධත්වය පල විය. සිංහල-බෞද්ධ රාජ්‍යයක "ඒකීය" ස්වභාවය පවත්වා ගත යුතු බව අවධාරනය කල ලියවිල්ල, දිස්ත්‍රික්ක මට්ටමේ දී වඩාත් සීමිත විමධ්‍යගත කිරීමක් වෙනුවෙන් පවතින පලාත් සභා පද්ධතිය ඉවත ලිය යුතු යැයි යෝජනා කලේ ය. සැලසුම මගින් තථ්‍ය ලෙස ඉරා දැමුනේ 2002-03 සාම සාකච්ඡාවල දී ඉදිරිපත් කරන ලද තාවකාලික යෝජනාවන් පමනක් නො වේ. එය ඉන්දු-ලංකා ගිවිසුම යටතේ 1987 දී පිහිටුවන ලද පලාත් සභා සැකැස්ම ද ඉරා දැමී ය. සම්මුතියක් ඇති කර ගැනීම සඳහා පවතින කවර හෝ ඉඩකඩක් වුව ද විනාශ කිරීම මගින්, ලියවිල්ල ඇත්ත වශයෙන් ම යුද්ධ ප්‍රකාශ කිරීමක් බවට පත් විය.

ආරම්භ කල තැන් පටන් රැස්වීම් වාර 40කට වැඩි ගනනක් පවත්වමින් කෙසේ වෙතත් ඒපීආර්සීය දිගට ඇදෙන්ට විය. "ඒකීය රාජ්‍යය" වෙනුවට වෙනත් සම්මුති සහගත පදයක් ආදේශ කිරීමටත් පලාත් සභා තව දුරටත් පවත්වා ගෙන යාමටත් අනෙකුත් පක්ෂ දැරූ ප්‍රයත්නයන්ට, ශ්‍රීලනිපය හෙල උරුමය හා මඑපෙ සමග එක්ව විරුද්ධත්වය පල කරමින්, දිගින් දිගට ම ව්‍යාජ "විවාදයක්" ගෙන ගොස් තිබේ.

ඊනියා බහුතරයට පාලක සන්ධානයේ කොටස්කරුවන් වී සිටින පක්ෂ ගනනාවක්, විශේෂයෙන් ම වාමවාදී ලංකා සමසමාජ පක්ෂය (ලසසප) හා ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය (කොප) ඇතුලත් වෙයි. මේ පක්ෂ සම්බන්ධයෙන් ගත හොත්, ආක්‍රමනකාරීව යුද්ධයක් ගෙන යන ආන්ඩුවක සේවය කරමින් සිටින ගමන් "සාමය උදෙසා" කටයුතු කරන බව කියා පෑමේ හැකියාව ඔවුන්ට ලබා දෙමින් ඒපීආර්සීය ප්‍රයෝජනවත් දේශපාලනික මුලාකරනයක් ලෙස සේවය කර තිබේ. පසු ගිය වසරේ දී විරුද්ධ පාක්ෂික එජාපය ඒපීආර්සීයට එක් වුව ද සමාප්ති වාර්තාවක් ඉදිරිපත් කිරීමට ආන්ඩුව අසමත් වී ඇතැයි චෝදනා කරමින් අගෝස්තු 17 වන දා ඉන් ඉවත්ව ගියේ ය.

අප්‍රේල් 15 වන දා අයිලන්ඩ් පත්‍රයට කල අදහස් දැක්වීමක දී ලසසපයේ පාර්ලිමේන්තු සභිකයෙකු ද වන ඒපීආර්සී සභාපති විතාරනගෙන් කමිටුවේ සැබෑ අරමුන එලියට පැන්නේ ය. සිංහල අන්තවාදී පක්ෂවලට ආයාචනයක් කරමින් ඔහු මෙසේ කියා සිටියේ යඃ " එල්ටීටීඊය පරාජය කරන්න තියෙන හොඳ ම ක්‍රමය වෙන්නෙ ඒපීආර්සී යෝජනා ඔස්සේ දෙමල ජනයා ආන්ඩුවේ පැත්තට දිනා ගෙන ඔවුන් හුදෙකලා කිරීම බව අවධාරනය කරන්න මම කැමති යි." වෙනත් වචනවලින් කිව හොත්, ඒපීආර්සීය වනාහි යුද්ධය දිනීම සඳහා ආන්ඩුව ගෙන යන ප්‍රචාරක ව්‍යාපාරයක කොටසක් වේ.

අගෝස්තු 19 වන දා කමිටුව අත්හිටුවීමෙන් පසුව ද ඒපීආර්සීය සම්බන්ධ මතභේද තව තවත් ගැඹුරු විය. ෆෙඩරල් වර්ගයේ බලය විමධ්‍යගත කිරීමකට ශ්‍රීලනිපය එකඟ වුව හොත් "එය ආන්ඩුව මෙතෙක් සිදු කල නැවත හරි ගැස්විය නොහැකි ම වරද වනු ඇතැ"යි අගෝස්තු 22 වන දා පැවති පුවත්පත් සාකච්ඡාවක දී ජවිපෙ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ අනතුරු ඇඟවී ය. ආන්ඩුව ඒකීය රාජ්‍යයට බැඳී සිටින බවත්, එහෙත් "ඒකීය රාජ්‍යයක සීමාව තුල හැකි උපරිම මට්ටමට බලය විමධ්‍යගත කිරීම මත පදනම් වන කවර විසඳුමකට වුව එකඟ විය හැකි" බවත් කියමින් පසු දා ශ්‍රීලනිප ප්‍රකාශක ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඊට ප්‍රතිචාර දැක්වී ය.

මේ දේශපාලනික සූත්‍රය නිසැකව ම, ජවිපෙ අස්වසන අතරවාරයේ ම බලය විමධ්‍යගත කල යුතු ආකාරය පිලිබඳව අනෙකුත් පක්ෂ සමග දිගින් දිගට ම සාකච්ඡා කරමින් ඒපීආර්සීය පන ගස්වා තබා ගැනීම සඳහා දරන තුනී ලෙස ආවරනිත ප්‍රයත්නයකි. එමෙන් ම ඒපීආර්සීයේ සාකච්ඡා දිගින් දිගට ම සිදු වෙමින් පවතින්නේ ය යන මවා පෑම පවත්වා ගෙන යාම සඳහා, රාජපක්ෂ සියලු පක්ෂවල නායකයන් සමග සාකච්ඡා කිරීමට අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායකට නියම කලේ ය. මේ පරෙස්සම් සහගත තුලනය කිරීමෙහි අරමුන හුදෙක් ව්‍යාජ සැරසිල්ලක් ලෙස ඒපීආර්සීය

පවත්වා ගෙන යාම පමනක් නො වේ. අස්ථාවර පාලක සන්ධානයට මුක්කු ගැසීම ද එහි අරමුනක් වේ.

රාජපක්ෂගේ සන්ධානයට ඇතුලත් වන්නේ හෙල උරුමය හා මඑපෙ පමනක් නො වේ. සාමාජීය පදනම වශයෙන් ගත් කල ආන්ඩුඩ යලි යුද්ධය ආරම්භ කිරීමට සතුරුව සිටින දෙමල හා මුස්ලිම් ජනයා මත පදනම් වූ පක්ෂ ද ඊට ඇතුලත් වෙයි. ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය (ශ්‍රීලමුකො), ජාතික සමගි පෙරමුන (එන්යූඑෆ්) සහ කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) මේ අතරට ඇතුලත් ය. ලංකා කම්කරු කොන්ග්‍රසය (සීඩබ්ලිව්සී) ආන්ඩුවේ කොටසක් ලෙස සිටිය ද මෑතක දී ඉන් ඉවත් වී විරුද්ධ පක්ෂයට එක් විය. "වාම" පක්ෂ, එනම් ලසසපය හා කොපය, ඒපීආර්සීය යුද්ධය අවසන් කිරීම සඳහා සාම සැලැස්මක් සකස් කරමින් සිටින්නේ ය යන ව්‍යාජය පවත්වා ගෙන යාමේ කඩ ඇනය ලෙස ක්‍රියා කරයි.

ඒපීආර්සීය තථ්‍ය වශයෙන් ම බිඳ වැටීම යනු යුද්ධයට, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට ආන්ඩුව එල්ල කරන ප්‍රහාරයට හා ජීවන තත්ත්වයන් දිගින් දිගට ම පිරිහීමට එරෙහිව වැඩෙන මහජන විරුද්ධත්වය මධ්‍යයේ පාලක සන්ධානය තුල පවතින අන්තයට ම ගිය ආතතියේ තවත් එක් සංඥාවක් පමනකි.

© www.wsws.org